


## ස්තුති පූර්වක දැනුම් දීමයි

පාරමිතා බෞද්ධ විහාරයේ ගොඩනැගිලි අරමුදලට ආධාර ලබා ගැනීම සඳහා සංවිධානය කල ලොතරැයි දිනුම් ඇදීම අති සාර්ථකව අවසන්වූ බව ඉතා සතුටින් දැනුම් දෙමු.

මෙම ලොතරැයිය ආරම්භ කිරීමට වාහනය සඳහා මුදල් පරිත්‍යග කල පිංවත් මහතාටත්, විහාරස්ථානයේ ගරු ස්වාමින්වහන්සේලාටත්, අප වෙත අනුග්‍රහය ලබාදුන් අනුග්‍රාහක ආයතනවලටත්, ලොතරැයි පොත් අළෙවි කරදුන් සහ මිළදී ගත් මෙල්බන් වාසි සැමටත්, නන්අයුරින් සහායදුන් සැම දෙනාටත් අපගේ ස්තුති පූර්වක ප්‍රණාමය පුදකර සිටිමු.

අපගේ දැන්වීම් පළකරදුන් පහන, සන්නස, සිහනද හා කැඩපත පුවත්පත් වලටත් අපගේ නිවේදන ප්‍රචාරය කරදුන් 3 ZZZ, ලක්මිහිර හා සෙනසුරාදා FM 97.4 ගුවන් විදුලි නාලිකා වලටත් අපගේ ස්තුති පූර්වක ප්‍රණාමය පුදකර සිටිමු.

මෙම ව්‍යාපෘතියෙන් ලැබූ සියලු ලාභය අලුතින් ඉදිකිරීමට නියමිත නව විහාරස්ථාන අරමුදළ සඳහා බැර කල බව සතුටින් දැනුම් දෙමු.

**මේ සියලු පිං ඔබ සැමට අනුමොදන් වේවා !**

මෙයට බටහිර වික්ටෝරියානු ශ්‍රී ලංකා බෞද්ධ සංගමය.



(පින්තූරයේ වමේ සිට පාරමිතා බෞද්ධ විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය ශාස්ත්‍රපති පල්ලේවෙල දේවරක්ඛිත ස්වාමින් වහන්සේ, ලොතරැය සංවිධානය කල කීර්ති ජයකොඩි, ලොතරැයි යේ ජයග්‍රාහක ශාමල් පෙරේරා, Lemans Toyota Deer Park සම්බන්ධීකරනය කල නාලක සමරතුංග.)



## ක්‍රීඩකයෝ සහ දෙවියෝ

නිරෝෂන් දික්වැල්ල, පන්දුවෙන් පන්දුවට කුරුසය ගසන්නේය...
නමුත් ඔහුට පන්දු පනහකට වඩා කුරුසය ගැසීමට අවස්ථාව ලැබෙන්නේ කලාතුරකිනි.
දේව කැමැත්ත ඒ ලෙසය..

සුරංග ලක්මාල්, සුරයක් දමාගෙන පන්දු යවන්නේය...
සමහර දින වලදී ඔහුට කඩුලු ලැබෙන්නේය... ඒ සුරයේ බල වැඩි දිනවලටය.. සමහර දිනවලට එකදු කඩුල්ලක් හෝ නොලැබෙන්නේය..
ඒ සුරයේ බල බිඳුනු දිනවලටය..

ඇන්ජලෝ මැතිව්ස්, තමන් නායකත්වය දරද්දී දෙවියන් වහන්සේ ලබාදුන් සහයෝගය සහ ජයග්‍රහණ ගැන ප්‍රසිද්ධියේම කියා ඇත...
නමුත් වැඩි කාලයක් නායකකම් කිරීමට ඔහුට අවස්ථාව ලැබුනේ නැත...
දේව කැමැත්ත ඒ ලෙසය..

දිනේෂ් චන්දිමාල්, ජාත්‍යන්තර මාධ්‍ය ඉදිරියේ පවා ගංගා මෑණිගෙන් ඔහුට ලැබෙන ආශිර්වාද ගැන පවසා ඇත...
පකිස්තානයට එරෙහිව ලැබූ ජය, ගංගා මෑණියන්ගේය...
නමුත් ඉන්දියාව ඉදිරියේ ඇය අසරණය..
ඒ ගංගාගේ දේවෝත්තමයාණන්ගේ කැමැත්තය..

පකිස්ථානයේ ක්‍රීඩකයෝ පුදුම ඇදහිලිවන්තයෝය...
ඔවුන් ජයගන්නා සියලූ තරග වලට, අල්ලා දෙවියන්ගේ ආශිර්වාදය ලැබෙන්නේය..
ඔවුන් පරාජය වන තරග වලට අල්ලා දෙවියන් සම්බන්ධ නැත..
ක්‍රිස්තු භක්තිකයෙකු වූ යූසුෆ් යොහානා, පසුකලෙක ඉස්ලාම් භක්තිකයෙකු වීමෙන් පසු කණ්ඩායමේ දක්ෂතම පිතිකරුවා බවට පත්විය..

තිලකරත්න ඩිල්ෂාන්, කණ්ඩායමට පැමිණි මුල්සමයේ ඉස්ලාම් භක්තිකයෙකු විය.. නමුත්, පසුකලෙක ඔහු බෞද්ධයෙකු බවට පත්විය.. දානමාන පිංකම් වලට සහභාගි විය.. කාලයත් සමග ලකුණු අතරට පැමිණ දක්ෂතා පෙන්වන්නට විය...
අල්ලාගෙන් නොලැබුනු ආශිර්වාදයක්, කුමන හෝ බෝධියකින් ඔහුට ලැබෙන්නට ඇත..

ශ්‍රී ලංකා කණ්ඩායමේ නව නායකයා ලෙස තිසර පෙරේරා පත්ව ඇත..
පන්දු යැවීමට බාරගත් සැනින් කුරුසය ලකුණු කරන ඔහු, නායකත්වය බාර ගත් සැනින් සාංඝික දානයක් පවත්වා ඇත...
දෙවියන්ටත් වඩා, මේ රටේ අධිපති මතවාදය ගැන තිසරට ඇති අවබෝධය ලබාදුන් දෙවියන්ට ස්තූති කළ යුතුය...

ක්‍රිකට් ජයග්‍රහණ ගැන කිසිදු බලාපොරොත්තුවක් නැති සමයක, තිලංගට සහ දයාසිරිට යෝජනාවක් කිරීමට කැමතිය...
කුඩා ප්‍රමාණයෙන් හෝ යාඥා කුටියක්, ධාතු මන්දිරයක්, ගංගා මෑනියන්ට කාමරයක්, කෝවිලක්, හක්ගෙඩියාට මංජුලට සහ ආසිරිට ඒකාබද්ධ කුටියක් යනාදී ලෙස, ශ්‍රී ලංකා ක්‍රීඩකයන් රැඳෙන ක්‍රීඩාගාරය අසලින් ඉදිකර ඔවුන්ට අවශ්‍ය ආධ්‍යාත්මික බලය ලබාගැනීමට උපකාර කළ යුතුය

**ප.ලි - මේ මොහොතේ ලංකාවට එරෙහිව ලකුණු සුනාමියක් එවමින් සිටින විරාට් කෝලි නිරාගමිකයෙකු නොවේ..**
**ඔහු තම ආගමික වතාවත් වල යෙදෙන ඡායාරූප ද අන්තර්ජාලයේ හිඟ නොවේ...**
**නමුත්, ඔහු කිසිවිටෙක ආගම ක්‍රීඩාපිටිය මැදට ගෙන එන්නේ නැත..**
**තම දක්ෂතාවයෙන් රැස්කරන ලකුණු හෝ ලබාගන්නා ජයග්‍රහන, වෙනත් බලවේගයක ගිණුමට ප්‍රසිද්ධියේ බැර කරන්නේද නැත...**
**ඔහු සමස්ථ ඉන්දියානුවන්ගේම ආදරය ලැබීම, තම ආගමට හෝ විශ්වාසයන්ට වහල්කම් කරන්නට ගොස් නැති කරගන්නේ නැත**

මේ සටහන,
කෝලිගේ භාවිතාව තේරෙන උන්ටය...
නොතේරෙන උන්ට අයින් වෙලා පයින් යන්නට හැකිය

From George Debara’s Facebook Page